www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ලෝක සමාජවාදී වෙබ් අඩවිය ආසියානු සුනාමි ව්‍යසනය ගැන ඕස්ට්‍රේලියාවෙහි ප්‍රසිද්ධ රැස්වීම් පවත්වයි

## WSWS holds public meetings in Australia on Asian tsunami disaster

**ලෝරා ටියෙර්නාන් විසිනි**
**2005 පෙබරවාරි 08**

ආසියානු සුනාමියෙන් පැන නැංවූ ගෝලීය දේශපාලන ප්‍රශ්න පිලිබඳව සාකච්ඡා කිරීම සඳහා *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* පසු ගිය සතියෙහි ඕස්ට්‍රේලියාවේ දී සාර්ථක ප්‍රසිද්ධ රැස්වීම් දෙකක් පැවැත්වී ය. ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) ප්‍රධාන ලේකම් විජේ ඩයස් සිඩ්නි හා මෙල්බර්න්හි රැස්වීම් ඇමතූ අතර ලෝසවෙඅ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සභාපති ඩේවිඩ් නෝර්ත් සිඩ්නිහි දී ඔහු සමග එක් විය.

සිඩ්නි රැස්වීමේ මුලසුන දරමින් ඕස්ට්‍රේලියානු සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම් නික් බීම්ස් සඳහන් කලේ මහජනතාව කෙරෙහි සිය නො තැකීම හා පිලිකුල ප්‍රකාශයට පත් කරමින් විපතට පත් ලක්ෂ ගනනක් දෙනා වෙත නින්දිත හා පාර්ශ්වීය සහයෝගය පිලිගැන්වූ බලවත් රටවල දේශපාලඥයන්ට මුලුමනින් ම වෙනස් ආකාරයකට සෑම රටක ම ජනතාවගේ පුලුල් කොටස් දෙසැම්බර් 26 දා සිදුවීම්වලට මහත් උනන්දුවෙන් ප්‍රතිචාර දැක්වූ බව යි. කම්කරු පන්තිය මුහුන දෙන තීරනාත්මක කර්තව්‍යය වන්නේ ව්‍යසනයෙන් පැන නැංවූ ඓතිහාසික හා දේශපාලන ප්‍රශ්න සාකච්ඡා කිරීම හා එම පදනම මත ජාත්‍යන්තර කම්කරු පන්තිය සඳහා දේශපාලන විකල්පයක් විස්තාරනය කිරීම බව බීම්ස් සඳහන් කලේ ය.

සිඩ්නි රැස්වීම ඇමතූ ලෝසවෙඅ ජාත්‍යන්තර කර්තෘ මන්ඩල සාමාජික පීටර් සිමන්ඩ්ස් ඉන්දියානු සාගරයෙහි සුනාමි අනතුරු ඇඟවුම් පද්ධතියක් නො වීම කෙරෙහි අවධානය යොමු කල අතර දෙසැම්බරයේ සුනාමියෙන් සිදු වූ දැවැන්ත මරන සංඛ්‍යාව සම්පූර්නයෙන් ම වලකා ගත හැකිව තිබුනේ කෙසේ දැයි පෙන්වා දුන්නේ ය. ''වේගවත්ව දත්ත විශ්ලේශනය කිරීමේ හැකියාවෙන් යුත් පරිගනක අනුරූකරනයේ පදනම මත ගොදුරු විය හැකි ප්‍රදේශ වෙත අනතුරු ඇඟවීම් නිකුත් කරන්නා වූ'' අධිතාක්ෂන අනතුරු ඇඟවුම් පද්ධතියක් 1960 ගනන් මුල සිට ම ශාන්තිකර සයුරෙහි ස්ථානගතව තිබේ.

වත්මන් තාක්ෂනික ශක්‍යතාව පිලිබඳ හොඳ ම නිදසුනක් වන්නේ ජපානයෙහි ඇඟවුම් පද්ධති ය යි: ''රට පුරා ඇති 3,500ක් පමන වන භූ කම්පන සංවේදක හා 180ක් පමන වන භූ කම්පන නිරීක්ෂන මධ්‍යස්ථානයන්, උදම් නිරීක්ෂන මධ්‍යස්ථාන හා ගැඹුරු මුහුදු සංවේදක 80ක ජාලයකට සම්බන්ධ කර විසිහතර පැය පුරා ම නිරීක්ෂනයට ලක් වේ. කෘත්‍රිම ප්‍රතිඵල 100,000ක් රැස් කල හැකි පරිගනක වැඩ සටහනක් මගින් සුනාමියක් හට ගැනීමට තිබෙන ඉඩ කඩ පිරික්සා විනාඩි තුනත් පහත් අතර කාලයක දී අනතුරු ඇඟවුම් නිකුත් කරයි. අනතුරු සංඥා වහා ම රූපවාහිනී නාලිකාවන් හරහා විකාශනය කරන අතර ගොඩබිම් හා චන්ද්‍රිකා සන්නිවේදනය මගින් හදිසි අවස්ථා පිලිබඳ ආයතනයන් වෙත ඒවා දැනුම් දෙයි. ප්‍රධාන වරායන් සහ ඉදි කිරීම් ආරක්ෂා කිරීම සඳහා දැවැන්ත දිය කඩන හා ජල දොරටු මාලාවක් ඉදි කර තිබේ.''

අනතුරු පිලිබඳව විද්‍යාඥයන් නිරතුරුව ලබා දෙන උපදෙස් හා සුනාමි අනතුරු ඇඟවුම් පද්ධතියක් ගොඩ නැගීමට ඉල්ලීම් කල ද ඉන්දියානු සයුරෙහි මින් එකක් වත් නො පවතියි. එහි ප්‍රතිඵලයක් ලෙස බෙංගාල බොක්කේ වෙරල බඩ වෙසෙන මහජනතාවෝ මෙම තත්වයට පරිපූර්නව ම නුසූදානම් ව සිටියහ.''

ශ්‍රී ලංකාවේ 40,000කට අධික සංඛ්‍යාවකට සිය ජීවිත අහිමි කල සුනාමියෙහි බල පෑම පිලිබඳ සවිස්තර දේශපාලන දැක්මක් ප්‍රධාන කථිකයා වූ විජේ ඩයස් විසින් සම්පාදනය කලේ ය. (ඔහු ගේ සම්පූර්න කතාව හෙට දින පල කෙරෙනු ඇත.)

සිය සිඩ්නි කතාව අරඹමින් විජේ සඳහන් කලේ මෙම පෙබරවාරි 4 වන දින බ්‍රිතාන්‍ය විජිතවාදී පාලනයෙන් ශ්‍රී ලංකාව ලද ඊනියා නිදහසේ 57 වන සංවත්සරය බව යි. එහෙත් සුනාමියේ විනාශකාරී ප්‍රතිඵල පෙන්වා දෙන්නේ රටේ ආර්ථික පසුගාමීත්වය, මහා බලවතුන්ට එහි අඛන්ඩ ආර්ථික හා දේශපාලන යටත් වීම සහ දිවයින පුරා කම්කරුවන් හා පීඩිත ජනතාව මුහුන දෙන දරිද්‍රතාවයේ අධම කොන්දේසි ය.

මානුෂික සහන සේවා කටයුතු කෙරෙහි පක්ෂයේ ආකල්පය ද ඇතුලුව සුනාමි ව්‍යසනය කෙරෙහි මූලධර්මාත්මක මාක්ස්වාදී ප්‍රතිචාරයන් විජේ කැටි කර දැක්වී ය: ''අපි ඔවුන්ගේ කටයුතු ඉමහත් ලෙස අගයන්නෙමු. කෙසේ වුව ද අපගේ ප්‍රධාන කර්තව්‍යය වන්නේ ජරපත් ධනවාදී පද්ධතිය යටතේ මහජනතාව යටත් කොට ඇත්තා වූ වහල් භාවය සහ පීඩක සමාජ හා දේශපාලන කොන්දේසි පෙරලා දැමීම සඳහා ඉදිරි දර්ශනයක් හා ක්‍රියා මාර්ගයක් සම්පාදනය කිරීම යි. සහන සේවා කටයුතු සැලකිල්ලට ගත හොත් සුනාමියෙන් විපතට පත් වූවන්ගේ අවශ්‍යතා සම්පාදනය රාජ්‍යයේ හා ආන්ඩුවේ වගකීමකි ය යන අවබෝධය අපි කම්කරු ජනතාව අතර වර්ධනය කල යුත්තෙමු.''

අවතැන් වූවන් සඳහා ඉඩම් හා නිවාස වහා ම ලබා දීම, ආදායම් මාර්ග අහිමි වීම වෙනුවෙන් විපතට පත් වූවන් සඳහා මූල්‍ය වන්දි, රෝහල්, පාසල්, මංමාවත් හා සන්නිවේදන පද්ධති යලි ගොඩ නැගීම සඳහා පොදු වැඩ ක්‍රියා මාර්ගයක් ඇතුලු ඉල්ලීම් මාලාවක් ඔහු විස්තාරනය කලේ ය. ''යුද කටයුතු සඳහා වෙන් කල මුදල් ද ධනවත්කම මත පොහොසතුන්ගෙන් බදු අය කර ගැනීමෙන් ද අරමුදල් සම්පාදනය කල යුතු ය.''

ලෝසවෙඅ ජාත්‍යන්තර කර්තෘ මන්ඩල සභාපති ඩේවිඩ් නෝර්ත් සිඩ්නිහි අවසන් කථිකයා විය: ''සුනාමියේ ප්‍රබල ශක්තිය ගැන බොහෝ දේ කියා ඇත: මරනය හා විනාශය ගෙන එමින් ජාතීන් පිසදා ගෙන යාම, එහෙත් කෙනෙකුට කල හැක්කේ බලාපොරොත්තු සුන් වූ අයුරෙන් දෙඋර හකුලා 'ඒ ඉරනමයි' යි පැවසීම පමනි.'' එවැනි අදහස්වල ඇතුලත්ව පවත්නා ප්‍රතිගාමී දෘෂ්ටිවාදී ප්‍රවිෂ්ටය නෝර්ත් ප්‍රතික්ෂේප කලේ ය.

''සමාජවාදී ව්‍යාපාරයේ පදනම් හා මූලික සංකල්ප යලි ස්ථාපනය කිරීම'' අවශ්‍ය බව නෝර්ත් අවධාරනය කලේ ය. විසි වන සියවස මුල් භාගයෙහි එක්සත් ජනපදය තුල පැවති වියලි පරිසර තත්වයන්ට පුලුල් පොදු කාර්ය ක්‍රියා මාර්ගයකින් මුහුන දුන් ආකාරය ඔහු සිහියට නැංවී ය. ''මෙම ගැටලු ජයගැනීමට අවශ්‍ය මාධ්‍යයන් පවත්නේ ය. යන විශ්වාසයක් එහි විය: ඒ නියගය හා කාන්තාර කොහි පවත්නේ ද, එතැන වාරිමාර්ග පද්ධති ගොඩ නැංවිය හැකි ය යන්න යි.''

සමාජවාදී ව්‍යාපාරයේ අනාගත වක්තෘන් ''ග්‍රහලෝක පරිවර්තනය කල හැකි ආකාරයට විද්‍යාව ප්‍රයෝජනයට ගැනීමේ හැකියාව මිනිසා සතුව ඇතැයි තර්ක කල බව හා විශ්වාස කල බව'' නෝර්ත් පැවසී ය. ''මෙම සංකල්පවල දී දහඅට වන සියවසේ ප්‍රබුද්ධත්වයෙහි මතු නො ව ඉනුත් තවත් පසු පසට ගොස් දහතුන් වන හා දහහතර වන සියවස්වල ඇරඹි පුනරුදයට මුල පිරූ බුද්ධිමය ජීවය මත සමාජවාදීහු පදනම් වී ගත්හ. මෙලෙස මෙම කරුනු ගැන අප අද දින සැබවින් ම තර්ක කල යුත්තේ මක් නිසා ද? යථාර්ථය නම් මෙම සියලු ගැටලු සමග පොරබැදීමට අවශ්‍ය බලය හා ශක්‍යතාව මිනිසා සතුව තිබීම යි. ඔවුන්ගේ අධිෂ්ඨානයට ලොකු ම බාධාව ඇත්තේ සොබාදහමෙහි නො ව සමාජයෙහි ය.''

''සුනාමියක් යනු දිනක් පාසා සිදු වන ව්‍යසනයන්හි ගුනාත්මක තීව්‍රකරනයක් පමනකි'' යි නෝර්ත් පෙන්වා දුනි. ඒඩ්ස් රෝගය නිසා අප්‍රිකාව තුල කී දහසක් දෙනා දිනපතා මරුමුවට පත් වේ ද? පිරිසිදු ජලය ලබා ගත නොහැකි කමින් බොහෝ කලකට පෙර තුරන් කර දැමිය යුතුව තිබූ අතීසාරය හා අනෙකුත් ප්‍රාථමික ලෙඩ රෝග නිසාත් ලොව පුරා කී දහසක් නම් තරුන ජනයා දෛනිකව මරු දකිත් ද?''

මුග්ධත්වයේ සියලු රූපාකාරයන්ට හා පෞද්ගලික ධනය පසුපස අන්ධ ලෙස හඹා යාමට එරෙහිව සමාජවාදය ආරක්ෂා කරමින් ඔහු සිය කතාව සමාප්ත කලේ ය, ''සමාජවාදය මිය ගොසින් යයි මහා ව්‍යාපාරිකයන්ගේ මාධ්‍ය තෝල්කයන් නිවේදනය කරන විට ඔවුන් සත්‍ය වසයෙන් ම කියන්නේ කුමක් ද? ඔවුන් කියන්නේ පෞද්ගලිකව ධනය රැස් කිරීමත් ලාභය හඹා යාම මත පදනම් වූ සමාජ සංවිධානයේ මූලධර්මවලට යම් හෝ විකල්පයක් ඇතැයි විශ්වාස කිරීමත් අභූතයක් බව යි. එයට විකල්පයක් නැත. ඔබට ඒ ගැන සිතන්ට වත් බැරි ය. එය නො විය හැකි ය. සමාජවාදයේ මරනය නිවේදනය කිරීමේ දී ඔවුන් එසේ කරන්නේ සමාජ සැලසුම්කරනය පිලිබඳ මූලධර්මයේ මරනය යි, අපගේ සමාජ පැවැත්මෙහි මුග්ධත්වයේ සියලු රූපාකාරයන් ජය ගැනීම පිනිස තර්කය, බුද්ධිය, විද්‍යාව ප්‍රයෝජනයට ගැනීම නො සිතිය හැක්කක් බව යි. සමාජවාදය වනාහි සමාජවාදී ව්‍යාපාරයේ තවත් ශ්‍රේෂ්ඨ මූලධර්මයක් වන සැබෑ සමානතාවේ සමාජයක් ගොඩ නැංවීම සඳහා සොබාදහමේ හා මිනිසාගේ කුසලතාවේ සකලවිධ බලවේග සන්නද්ධ කර ලීමට විද්‍යාව එනම් සොබාදහමේ හා මානව සංවර්ධනයේ නියාමයන් තුලට වන මිනිසාගේ අන්තර්ඥානය ප්‍රයෝජනයට ගැනීම යි.''

සුනාමියේ ප්‍රතිඵල, මහ බලවතුන් ප්‍රදානය කල ආධාර මුදල්වල ස්වභාවය හා අරමුන පිලිබඳව සහ සමාජවාදී සමානතා පක්ෂයේ ඉදිරි දර්ශනය ගැන උත්සුක වෙමින් රැස්වීම් දෙකෙහි දී ම ශ්‍රාවකයෝ විජේ වෙත ප්‍රශ්න මාලාවක් ම යොමු කලහ.

කම්කරු පන්තිය විප්ලවවාදී ලෙස බලමුලු ගැන්වීමට ස්වාභාවික ව්‍යසනයත් සහාය කර ගත හැකි දැයි ඇසූ ශ්‍රාවකයෙකුට පිලිතුරු දීමේ දී ලෙනින් සහ විවිධ වර්ගයේ රුසියානු රැඩිකල්වාදීන්ද ජනතාවාදීන්ද අතර පැවති මුල් යුගයේ දේශපාලන විවාදයක් විමසා බලන ලියොන් ට්‍රොට්ස්කිගේ *The young Lenin* (ද යංග් ලෙනින්) කෘතියට විජේ අවධානය යොමු කලේ

ය. සාගතය ප්‍රගතිශීලී ඓතිහාසික දූත මෙහෙයක් සපුරාලමින් සිටින්නේ ය යි ද එය රුසියාවේ කාර්මීකරනය සඳහා පදනම ලන්නේ ය යි ද විශ්වාස කිරීම නිසා සහන කටයුතුවල දී ජනතාවාදීන් සමග සහභාගි වීමට ලෙනින් අසමත් වූ බව කියා සිටි වොඩොවොසොව් එබඳු එක් රැඩිකල්වාදියෙකි.

ට්‍රොට්ස්කි මෙසේ පිලිතුරු දුනි: ''මේ පිලිබඳ වොඩොවොසොව්ගේ අතීත ස්මෘතීන් වනාහි ලිබරලුන්ගේ හා ජනතාවාදීන්ගේ මනස් තුල වූ උල්යානොව්ගේ (ලෙනින්ගේ ) මතවාදයන්හි විකෘති පිලිබිඹුව විනා එම මතවාදයන්ගේ නියෝජනය නො වේ. ගොවි ජනතාව නට්ටම් වීමෙන් ද විනාශයට ලක් වීමෙන් ද රටේ කාර්මීකරනය ඉදිරියට යනු ඇතැයි යන අදහස ම අභූතයකි. නට්ටම් වූ ගොවීහු නිර්ධනීන් බවට නො ව දිලින්දන් බවට පත් වූහ. සාගතය ආර්ථිකයේ ප්‍රගතිශීලී ප්‍රවනතාවන් නො ව පරපුටු ප්‍රවනතාවන් පෝෂනය කලේ ය. කෙසේ වෙතත් වොඩොවොසොව්ගේ කතාවේ පක්ෂග්‍රාහී බව එම පැරනි මතභේදවල උනුසුම් වාතාවරනය ගැන පැහැදිලි අදහසක් ලබා දෙයි.''

විනාශයක් නිසා විප්ලවය පැන නැගිය හැකි ය යි මාක්ස්වාදීන් කිසි දා විශ්වාස නො කරන බව විජේ පහදා දුන්නේ ය. එහෙත් එබඳු විනාශයෝ තමන් යටත් වී දිවි ගෙවන පාලනයේ ස්වභාවය දෙස වඩා සෘජුව බැලීමට මහජනතාව මෙහෙයවයි. ''එබඳු තත්වයක දී මාක්ස්වාදීන්ගේ කර්තව්‍යය වන්නේ මෙම පරිහානිගත ධනවාදී පද්ධතියට සමාජවාදී විකල්පයක් පවත්නා බව මහජනතාව හමුවේ විශ්ලේෂනය කොට පැහැදිලි කිරීම යි. කම්කරු පන්තියේ හා පීඩිත මහ ජනතාවන්ගේ සවිඥ්ඥානක භාවය තමන්ගේ ම රාජ්‍ය බලය ගොඩ නැංවීමේ මට්ටමට ඔසොවා ලිය හැකි වනුයේ එම මැදිහත් වීම හරහා පමනකි.''

ශ්‍රී ලංකාව තුල සසපයේ හා *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* වැඩ කටයුතු වර්ධනය කිරීම සඳහා ඩොලර් 1,000කට වැඩි ආධාර මුදල් රැස්වීම්වල දී එකතු විය.

© www.wsws.org